# පාස්කු නාට්‍යය

*දේශීය නාට්‍ය කලාවෙහි බෞද්ධ පූජා කර්ම, ශාන්ති කර්ම හා ජන නාට්‍ය ගමන් මගේ ලැබෙන කිතුනු ආගමික ජන නාට්‍ය විශේෂයක් ලෙස පාස්කු නාට්‍ය සම්ප්‍රදාය සැලකිය හැකි ය. එහෙත් සොකරි, කෝලම් වැනි සෙසු ජන නාටකවලට වඩා එය නාට්‍ය ලක්ෂණ හා මූලධර්ම අතින් තරමක් සංවර්ධිත ලක්ෂණ පිළිබිඹු කරයි.*

*උදා: බටහිර නාට්‍යවල දැකිය හැකි "ගැටුම" තරමක් දුරට මෙම කතා පුවතේ දිස්වන අතර සමාරෝපය, රංගනය, සංවාද, වේෂභූෂය, නාට්‍යෝපකරණ, රංගභූමි අලංකරණය, සංගීතය, රංග භූමිය යන නාට්‍ය ලක්ෂණ ද, පුළුල් ව දැකිය හැකිය. ඊට හේතුව වන්නේ දේශීය පාස්කු නාට්‍ය සම්ප්‍රදාය සඳහා බටහිර ජන වන්දනා සම්ප්‍රදායයේ සහ දක්ෂිණ භාරතීය තෙරුක්කූත්තුවල ආභාසය ලැබීම යි.*

*පාස්කු නාට්‍යයේ තේමාව වනුයේ ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගසා අනේක විධ දුක් දී ඝාතනය කළ ආකාරය සහ දින තුනකින් එතුමා මළවුන්ගෙන් උත්ථාන වීමයි.*

## ***<u>ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය සම්ප්‍රදායය ආරම්භ වී විකාශය වන අයුරු</u>***

1. 1728 *න් පසුව මන්නාරමට නුදුරු පේසාලේ, යාපනය සහ මීගමුව දූව වැනි ස්ථානවල පාස්කු නාට්‍ය පෙන්වීම ආරම්භ කිරීම.* 1728 *දී ගෝවේ සිට පැමිණි සාහිත්‍යය හා සංගීතය පිළිබඳ වියත් පූජකයකු වූ ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් රචිත දුක්ප්‍රාප්ති ප්‍රසංගය නම් ගද්‍ය කාව්‍ය කථකයෙකු විසින් භක්ති ස්වරයෙන් උච්චාරණය කරන විට සුරුවම් හෙවත් ප්‍රතිමා කර්මණ්‍ය කරමින් ඉපැරණි පාස්කු නාට්‍ය පෙන්වීම.*
2. 1839 *දී දූවේ පාස්කු රඟ දැක්වීම සඳහා ඉන්දියාවේ කොචින් නුවර සිට ගෙන ආ ඓතිහාසික ක්‍රිස්තු ප්‍රතිමාව යොදා ගැනීම. ක්‍රිස්තුතුමා මරණයට මුහුණ දෙන අවසන් අවස්ථාව "නූල් සූත්තර" මගින් සජීව අයුරින් නිරූපණය කිරීම.*
3. 1939 *දී මර්සලීන් ජයකොඩි පියතුමා ගේ පිටපතට අනුව දූවේ පාස්කු රඟ දැක්වීම, පිලාත් රජුගේ නඩු තීන්දුව දක්වා පමණක් ජීවමාන පිරිමි නළුවන් යොදා ගැනීම, ඉතිරි කොටස සඳහා ප්‍රතිමා යොදාගැනීම.*
4. 1939*න් පසුව ක්‍රමික ව නාට්‍ය අවසානය තෙක් ජීවමාන නළුනිළියන් ගේ රංගන දායකත්වය ලබා ගැනීම. අදත් ක්‍රිස්තුතුමා අවසන් හුස්ම හෙළන අවස්ථාව ඓතිහාසික ප්‍රතිමාව මගින් නිරූපණය කිරීම.*
5. 1923 *දී බොරලැස්සේ ලෝරන්ස් පෙරේරා විසින් බොරලැස්ස පාස්කු වේදිකාව නාට්‍ය සම්ප්‍රදායය ආරම්භ කිරීම. එය ලෝ ප්‍රකට ජර්මනියේ ඔබේර්අමගවු ග්‍රාමයේ දී වසර* 10*කට වරක් පෙන්වන පාස්කු නාට්‍ය ආදර්ශ කොට නිෂ්පාදනය කිරීම.*
6. *දූවේ, මීගමුවේ සහ වෙනත් ගම් නගරවල දෙව්මැදුරු ආශ්‍රිත ව මහ සිකුරාදා ජන වන්දනා වත් පිළිවෙත් සමඟ භක්ති අභ්‍යාසයක් ලෙස වර්තමානයේ දීත් පාස්කු නාට්‍ය පෙන්වීම.*
7. *බොරලැස්සේ පාස්කු වේදිකා නාට්‍ය ආදර්ශ කොට ගනිමින් ඇරඹුණ පාස්කු වේදිකා නාට්‍ය ප්‍රවණතාව ද ඉදිරියට යාම.*
   *උදා: ලෙස්ලි බොතේජු ගේ "එසේ ය අපි ඔහු මැරුවෙමු" නයිනමඩම මෙරිල් ප්‍රනාන්දු ගේ "ගොල්ගොතා", දූවේ ක්ලෙමන්ට් ප්‍රනාන්දු ගේ "කටු ඔටුන්න".*

පාස්කු නාට්‍ය සම්ප්‍රදායයේ ප්‍රධාන ධාරාව ලෙස ගිණිය හැකි දුවේ පාස්කු දුක්ප්‍රාප්ති නාට්‍යයේ රඟ දක්වනු ලබන ප්‍රධාන අවස්ථා පෙළ ගැස්වීම.

- ලෝක ආරම්භය සුගති උද්‍යානය තුළ ආදම් සහ ඒවා කතාව
- පිලාත් රජු ගේ මාළිගාව අසලින් ජෙරුසලෙම් නුවරට ජේසුතුමා ජනතාවගේ "හෝසන්නා" ජය ඝෝෂාවෙන් යුතු ව වැඩම කිරීම.
- අන්තිම රාත්‍රී භෝජනය.
- ද්‍රෝහි වූ ජුදාස් ජේසුතුමා සතුරන්ට පාවා දීම සඳහා පිටත් වීම.
- ගෙත්සමෙනි උයනේ දී ජේසුතුමා සතුරන් අතට පත් වීම.
- අන්නාස් සහ කයාෆාස් නායක පූජකවරුන් අබියස අනඩු ගුරු සභාව වෙත ජේසුතුමා ඉදිරිපත් කිරීම.
- ජේසුතුමා ගල් කණුවේ බැඳ කස පහර දීම.
- පිලාත් ආණ්ඩුකාරයා ජේසුතුමා මරණයට තීන්දු කිරීම.
- ජේසුතුමා ගේ කර මත කුරුසිය පැටවීම.
- වෙරෝනිකා නම් බැතිමත් ළඳ ජේසුතුමාගේ මුහුණ රෙදි කඩකින් පිස දැමීම.
- ජේසුතුමා කුරුසියේ ඇණ ගැසීම.
- ජේසුතුමා ගේ ශ්‍රී දේහය ගල්ලෙනෙහි තැන්පත් කිරීම.
- ජේසුතුමා මළවුන්ගෙන් උත්ථාන වීම.

<u>පාස්කු නාට්‍යයේ අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ</u>

- දුව පාස්කු නාට්‍යයේ නාඩගම් ලක්ෂණ ඇත.
- ආරම්භ කිරීමේ දී පූර්ණ විරිඳුව ගායනා කරනු ලැබේ.
- පොතේ ගුරා හෙවත් දේශනාවාදියා සහ අත්වැල එය ගායනා කිරීම.

"බිහි ව ලෝ තුළ දිළිඳු ගවලෙන, මුදා ගන්නට දෙරන වැසි සැම, ඇවිද තැන තැන පිබිදු මන සොඳ පසිඳු දෙව්දුගෙ වදනිනා, ඒදින දරුඃ බල සතුරු යුධ කැල ක්‍රෝධ ගිනි මැද පිසසු සේ ගොර කුරුසේ වද විඳ දැමුව එම සඳ සම්දු පණ නළ සැඟවුණා."

- අනතුරු ව දේශනාවාදියා මැවීම පිළිබඳ පුවත නාඩගම් ස්වරයෙන් උච්චාරණය කරයි. එය දේශනාව නම් වේ. " අපගේ ස්නේහවන්ත ස්වාමීන් වන දෙවිපියාණන් වහන්සේ......"
- ඒලෙස කතා පුවතේ මූලික සිදුවීම් දේශනාවාදියා විසින් නාඩගම් සම්ප්‍රදායයට අනුව ගායනයෙන් ඉදිරිපත් කිරීම.

## <u>රංගනය</u>

දුව පාස්කු නාට්‍යයේ නාට්‍ය ධර්මී ලක්ෂණ අතර රංගන ශිල්පීන් විසින් තම භූමිකා ලෝක ධර්මී ආකාරයට භාවාතිශය අයුරින් (Melodramatic Form) නිරූපණය කරනු ලැබීම.

- සංවාද නිර්මාණයේ තාත්ත්වික මෙන් ම භාවාතිශය විලාසයක් දක්නට තිබීම. නූර්ති භාෂා ලක්ෂණ ද දිස්වීම.
  උදා: " ජුදාස් (හති ලමින්)
  අහෝ නායක පූජකතුමෙනි ! මේ මොන අපරාධයක් ද? නිර්දෝෂ රුධිරයෙන් මේ ජුදා පොළොව තෙත් කරන්න ද යන්නේ?

කයාපාස්

පූදාස් නුඹට පිස්සුද?"

*රංගභූමිය*

- *ස්ථාවර රංග මණ්ඩපයක් හෙවත් වේදිකාවක් නොවීම.*
- *කොටස් තුනක් යුත් රංග භූමියකි. මාධ්‍ය වේදිකාව සහ දෙපස අතුරු වේදිකා දෙකකි. අන්තිම රාත්‍රී භෝජනය මැද භාගයේ දර්ශනය වන විට එක පැත්තක කයාපාස් පූජක තැන පූදාස් සමඟ කුමන්ත්‍රණය කිරීම දැක්වේ. මධ්‍ය වේදිකාව කුරුසිය ස්ථානගත කළ හැකි අයුරින් උස් ව පිහිටා තිබීම. (බොරලැස්ස රංග භූමිය කොටස් 5කි. දෙපස අතුරු වේදිකා දෙක බැගින් තිබීම.)*
- *සුරුවම් කර්මණ්‍ය කරනු ලැබූ මුල් කාලයේ පැවැති රංග භූමිය හෙවත් පාස්කු මණ්ඩප පේසාලේ හා පිටිපන වැනි දෙව්මැඳුරු අසල දක්නට තිබීම. ඒවා ස්ථාවර රංග මණ්ඩප වේ. පොළොව මට්ටමේ සිට අඩි 6ක් පමණ උසින් වේ.*

*<u>රංග භූමි අලංකරණ</u>*

- *රංග භූමි අලංකරණය ලෙස දූව හා බොරලැස්ස යන පාස්කු සම්ප්‍රදායවල දී චිත්‍ර වස්ත්‍ර භාවිත කිරීම.*
  *උදා: දූව පාස්කු නාට්‍යයේ ජෙරුසලම්පුරය චිත්‍රණය කරන ලද පසුබිම් තිරය*
- *බොරලැස්ස පාස්කුව රඟ දැක්වීමේ දී ජේසුතුමා ස්වර්ගයට නැගීම, පාවෙන වළාකුළු සමඟ ඉතා විචිත්‍ර ආකාරයට විදුලි ආලෝකය මගින් ඉදිරිපත් කළ බව. (ඩේලිනිවුස් 1936 අප්‍රේල් 19)*

*<u>ඇඳුම් පැලඳුම්</u>*

- *පාස්කු කතා පුවතට ගැළපෙන රෝම, යුදා, ඇඳුම් පැළැඳුම් මෙන් ම වර්තමානයේ දී දේශීය ඇඳුම් පැළැඳුම් ද එක් වී තිබීම.*
- *අංග රචනයේ දී විදේශීය ලක්ෂණ ද මිශ්‍ර වී තිබීම.*
  *උදා: රජ, සෙන්පති, නායක පූජක සඳහා උචිත රැවුළු වර්ග*
- *රෝම යුද්ධ භටයන්ගේ ඇඳුම්, තොප්පි, අත් පළඳනා යනාදිය යුදා ලෝගුව, යක්ෂයා නිරූපණය කරන කළු ලෝගු යනාදිය.*

*<u>නාට්‍යෝපකරණ</u>*

- *කාඩ් භාජන, ලන්ස, කඩු , කුසලාන (දූවේ දී මාළු කපන දිග මන්න පිහි යොදා ගෙනා ඇත.)*

*දූව පාස්කු නාට්‍යයේ දී කොටළුවා ලෙස රෝද සවි කරනු ලැබූ කළු ලී අනුරුව යොදා ගැනීමේ දී එය ඇදගෙන යාම. ගැමියන් කොටළුවා ආදරයෙන් හඳුන්වනුයේ 'කලු දයා' නමින් ය.*

*<u>සංගීතය</u>*

- *දූව පාස්කු සම්ප්‍රදාය නාඩගම් ලක්ෂණ මෙන් ම පසම් ළතෝනි ගායනා ද දෙව් මැදුරු ගීතිකා (කාන්තාරු සම්ප්‍රදායෙහි) ද යොදා ගෙන තිබීම.*
- *දූව පාස්කුවේ ජන ගී ආභාසය ද දක්නට ලැබීම.*

උදා : " සඳ පහනේ පිපි වැටකෙය මල සේ - සුවඳ දිදී තිබිලා

සඳ පහනේ පිපි මානෙල් මල සේ - රුවට රුවේ තිබිලා

සඳ පහනේ කිරි මුහුද වගේ - අහෝ සුදට සුදේ තිබිලා

ජේසු අනේ මේ කිමද වුණේ ඔබ - මුහුණ ලෙයින් තෙමිලා"

වෙරෝනිකා නම් යහපත් ස්ත්‍රිය ගයන පසම් ගායන මෙන් ම ප්‍රාණය නිරුද්ධ ජේසුතුමා දෙව් මවු උකුළෙහි තබන අවස්ථාවේ ගායනා කරනු ලබන විලාප ගීතය හෙවත් ළතෝනි ද ප්‍රේක්ෂක බැතිය වඩවයි. දෙව් මවු විලාපය දනවන පසම් ගායනයට උදාහරණ

" සුර ලොව්නේ බැස මෙදිනේ - මවු කුසිනේ බිහි වෙමිනේ

කුඹු දෙනනේ කිරි බොමිනේ- මිණි ලෙසිනේ වැඩුණ තැනේ

දිලෙන රනේ රුව ලෙසිනේ - මල් උයනේ සිටිය දිනේ

මෙම මරණේ ඔබට වුණේ - කිමද අනේ සුර රජුනේ

අයි.......... අයියෝ.........."

- බොරලැස්ස පාස්කු සම්ප්‍රදායේ දී උත්තර භාරතීය රාඩධාරි සංගීතය හා බටහිර සංගීතය යොදා තිබීම.

<u>නිෂ්පාදනය තුළ විශේෂතා</u>

- පොදුවේ පාස්කු නාට්‍ය සඳහා ගම්වල ජීවත් වන පිරිස නළුනිළියන් ලෙස යොදා ගැනීම.
- පාස්කු නාට්‍යවල නිසල පිළි රූ මෙන් නළුවන් ජීව රූප අයුරින් වේදිකාව මතට ගෙන ඒම. (Tableaux Vivants) උදා: ආදම් සහ ඒවා
- පාස්කු නාට්‍ය නිෂ්පාදනය දේශීය නාට්‍යයේ කලාවේ පෝෂණයට ඉවහල් වී ඇති බව.
  උදා: ධම්ම ජාගොඩ ගේ මළවුන් නැගිටියි
  ජයන්ත චන්ද්‍රසිරිගේ මෝරා
  මෙම නාට්‍යවල රංග කාර්යයෙහි ලා පාස්කු නාට්‍යයේ යම් ලක්ෂණ ඇතුළත් වීම.
- නළුනිළියන් 300 දෙනෙකු පමණ සහභාගී වීම.
- වර්තමානයේ දීත් කුරුසියේ ඇණ ගැසීමේ ජවනිකාව සඳහා ජේසුතුමාගේ භූමිකාව රගපාන ජීවමාන රංගන ශිල්පියා වෙනුවට දුවේ ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව යොදා ගැනීම.